# නර්තනය - II ශ්‍රේණිය

(පළමු වාරය )



The National e-learning Portal for the General Education

නිපුණතාව : ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම් අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම : ශ්‍රී ලාංකීය ගැමි නාටක හා සබැඳි පසුබිම අධ්‍යයනය කර සුවිශේෂී ලක්ෂණ ඉදිපත් කරයි.

# කෝලම් ගැමි නාටකය


උඩරට සම්ප්‍රදායට අයත් ප්‍රධාන ගැමි නාටකය සොකරී මෙන්ම පහතරට පළාතට ආවේණික වූ ගැමි නාටකය වන්නේ " කෝලම් " නාටකය යි. කොලම් නාටකයේ මූලික පරමාර්ථය වී ඇත්තේ හාස්‍ය උත්පාදන හා සමාජයේ දුර්වල තැන් සියුම් ලෙස උපහාසයට ලක් කරමින් සමාජ ශෝධනය කිරීමයි.

## කෝලම් නාටකයේ කතා පුවත

- මහා සම්මත රජුගේ බිසවට දඬුරුව දැකමේ ආශාවක් අති විය. මෙම පුවත දැනගත් සක්දෙවි. රජු විශ්වකර්ම දේව පුත්‍රයා ගෙන්වා පැවසීමෙන් පසු ඔහු මෙසේ මුහුණු කප්පවා රජුගේ උයනේ පසෙක තබා ගියේ ය.

  උයන්පල්ලන් විසින් මේ බව රජුට සැල කර පසුව එම මුහුණු ගෙන්වා නළුවන් මඟින් කෝලම් මඩුවක් රග දැක්වීය එය දුටු බිසවට සිනහ පහල වී දොලදුක සංසිදුනේය. එතැන් පටන් කෝලම් මෙලොව පැවත එන බව කෝලම් උපත් ගායනා වල සඳහන් වේ.

## කෝලම් නාටකය ප්‍රචලිත ප්‍රදේශ



## කෝලම් නාටකය පැවැත්වීමේ අරමුණු


- **විනෝදාස්වාදය ප්‍රධාන අරමුණ වේ.**
- **සමාජයේ ජීවත් වන විවිධ පුද්ගල චරිතවල දුර්වලතා උපහාසයට ලක් කිරීම මගින් සමාජ ශෝධනය.**
- **පූජාර්තයෙන්**
- **එදා සමාජයේ ජනතාව වෙහෙස මහන්සි වී එදා දවසේ වැඩ රාජකාරී හමාර කර ඔවුනගේ එම ආතතිය මහන්සිය මගහැරවීම උදෙසා**
- **සශ්‍රීකත්වය,**

මහා සම්මත රජුගේ බිසොවට ඇති වූ දොලදුක පදනම් කර ගනිමින් ගර්භ සංරක්ෂණයක් සඳහා සහ අතීතයේ දී පුජාර්තය මුල් කර ගෙනඳ කෝලම් නැවත පැවැත් වූ බව කෝලම් පුරාවෘතයෙහි සඳහන් වේ.

## කෝලම් නාටක රංග භූමිය

- මේ සඳහා එලිමහන් බිම් පෙදෙසක් යොදා ගනී. රඟමඩල කවාකාර ස්වරූපයක් ගනී. වටේට ලනු හෝ ගොක් රැහැන් ඇද සීමා වෙන් කර ඇත. රඟමඩල හඳුන්වන්නේ තානායම් පොල වශයෙනි. මෙහි එක් පසෙක කෙසෙල් පතුරු සහ ගොක් කොලයෙන් ඉදිකල මල් යහනකි. පිටුපසින් නළුවන්ට මුවාවීම සඳහා ගොරකා ගසක් සිටුවා බුරුල්ල අතු වලින් ආවරණය කල " වෙස් අත්ත " ඇත. වේදිකාව ආලෝකකරණය කරන ලද්දේ කොප්පරා පන්දම් සහ උණ බටයෙන් කල පන්දම් වලිනි.

රංග භූමිය වටා ලනු ඇද ගොප් රැහැන් ඇද ප්‍රේක්ශකයන් හා රඟ මඩල වෙන් කර සීමා පනවා ඇත. එක් පසෙකින් කාරිය කරවන රාල සිටින අතර බෙර වාදකයා, හොරණෑ වාදකයා සහ අත්වැල් ගායකයෝ ද වාඩි වී සිටිති. රඟමඩල පසෙකින් කාල පන්දම් ගස සිටුවා පඬුරු බැඳ ඇත. නළුවන් රඟමඩලට පැමිණීමට පෙර ඇදුම් පැළඳුම් මාරු කිරීම සඳහා වෙස් අත්ත පිටුපස පොල් අතු මඩුවකි. රංග භූමිය වටේට ආලෝකය ලබා ගැනීම සඳහා කොප්පරා පහන් දල්වා ඇත.


නේපත්‍යාගාරය
වෙස් අත්ත
පහන් පැල

## කෝලම් නාටකයේ ගායනය

කෝලම් නාටකය තුළ ගායනයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. කෝලම් ආරම්භයේ සිට අවසානය වන තෙක් ම සියලු චරිත සිද්ධීන් සහ චරිතවල ස්වභාවයන්ද ගායනාවලින් හඳුන්වා දෙයි. කාරියකරවන රාල හෙවත් පොතේගුරු ගායනය සිදු කරන අතර අත්වැල් ගායක කණ්ඩායම ඒ සඳහා සහය වෙති. හොරණෑ වාදකයා ගායනයට මුල පුරයි. ආඝාතාත්මක සහ අනාඝාතාත්මක ගායනා කෝලම් මඩුවේ අන්තර්ගත යි.

**ජසකෝලමේ එන කවි,**

පෙර සිට පැවත එන - සිරිතට පොදිය බැඳගෙන
උරපිට තබාගෙන - යෝධ ජසයා එය දුවගෙන

මේ ගම් පියසේ හේනේ මාමල - කොච්චර සිටියත් මංවගෙ වෙන නැත
රජවාසලයෙන් සළුපිළි අරගෙන - එන්නෙමි රජු වඩිනා පෙරමුණට

මං වගෙ පේඩි කතක් මනා - දුටුවා ද ලොවේ රැසිරෙන් දිනා
මං කළ පෙර පවකින් ගෙනා - මට හිමිවුනෙ නාකි වූ වෙසමුණා

කවි ගායනය ආඝාතාත්මක ගායනා වශයෙන් පෙන්වා දිය හැකි ය. සැම චරිතයක් ම සභාවට පැමිණීමට පෙර කෙටි කවි ගායනය මඟින් එම චරිතය හඳුන්වා දීම කෝලම්වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි.

## කෝලම් නාටකයේ වාදන

ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වශයෙන් පහතරට බෙරය වාදනය කරනු ලැබේ. ඊට අමතරව සුසිර වාදන භාණ්ඩය ලෙස හොරණෑව භාවිත කරනු ලැබේ.

මගුල් බෙර වාදනයෙන් කෝලම් නාටක ආරම්භ කරයි. කෝලම් නාටකය තුල පහතරට ශාස්ත්‍රීය බෙර පද වාදනය වන අවස්ථා දැකිය හැකිය.

**" ගුද ගති ගත ගුද ගුද ගති ගත " - ( නාග කන්‍යා , ගුරුළු රාක්ෂ, අණබෙර කෝලම වැනි නර්තනාංගවල )**

**" ගති ගත ගුම් රිම් ගත ගති ගත ගතිත ගතම් "- (මුදලි කෝලම,ගිරිදේවි වැනි නර්තනාංගවල)**

සරල පද, ගමන් තාල මෙන්ම සංකීර්ණ පද ද කෝලම් නාටකය තුල අන්තර්ගතය.

## කෝලම් නාටකවල එන විවිධ චරිත

කෝලම් නාටකය කවි, සංවාද සහ නර්තන අංගයන්ගෙන් සමන්විත වූවකි. එහි චරිත රඟමඩලට ප්‍රවිෂ්ට වන්නේ නර්තනය මාධ්‍ය කොට ගනිමිනි. කෝලම් චරිත මූලික ලක්ෂණ සැලකිල්ලට ගෙන ප්‍රධාන කොටස් තුනකට වෙන් කරනු ලැබේ.

**මානුෂ චරිත -** **ජසයා, ලෙංචිනා, පුරංසිනා, මුදලි, අප්පුහාමි, හෙංචා, නොංචි අක්කා, අණ බෙරකරුවා, ලියනාරච්චි, මරක්කල**

**අතිමානුෂ චරිත-** **නාග රාක්ෂ, ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, නාග කන්‍යා, ගරුඩ රාක්ෂ, පූර්ණක රාක්ෂ, නරසිංහ අවතාර**

**සත්තව චරිත -** **සිංහ, වලස්, ගොන්, කොටි, නරියා**

සමස්ත කෝලම් නාටකයේ චරිත නිරූපණ කාර්යයේ දී නර්තන අන්තර්ගත අවස්ථා කිහිපයක් සහ සුවිශේෂී නර්තන අංග පහත පරිදි වේ.

| චරිත නිරූපණ කාර්යයේදී නර්තන අංග | සුවිශේෂී නර්තන අංග | කතා පුවත් |
|---|---|---|
| පූර්ව රංග | අපර රංග | පූර්ව රංග |
| අණබෙර කෝලම | නාග රාක්ෂ කෝලම | සඳකිඳුරු |
| නොංචි කෝලම | ගුරුළු රාක්ෂ කෝලම | මනමේ |
| ජස කෝලම | මරු රාක්ෂ කෝලම | කාපිරි |
| ලෙංචිනා කෝලම | පූර්ණක රාක්ෂ කෝලම | අන්ධ භූත |
| හේවා කෝලම | නාග කන්‍යා කෝලම | වෙස්සන්තර |
| මුදලි කෝලම | ගරුඩ රාක්ෂ කෝලම | |
| ආරච්චි කෝලම | සුරබා වල්ලි කෝලම | |
| කරපිට කෝල | පංචනාරිෂට කෝලම | |
| | නාරිලතා කෝලම | |
| | සිංහ කෝලම | |
| | ගොං කොටි කෝලම | |

## රංග වස්ත්‍රාභරණ


වෙස් මුහුණු පැළඳීම වෙස් ගැන්වීමේ ප්‍රධානතම ක්‍රමවේදයයි. මේ සඳහා ස්ථිර වශයෙන්ම එක් එක් චරිතයන් සඳහා නිර්මාණය කරන ලද වෙස් මුහුණු ඇත. කඳුරු ලීයෙන් කපා වර්ණ ආලේප කල කෝලම් වෙස් මුහුණු වලින් චරිතයේ භාව ලක්ෂණ පැහැදිලිව නිරූපණය වේ.

පූර්ව රංග කොටසට අයත් පණිවිඩ කෝලම් වල චරිත නිරූපණ අවස්ථා වලදී සාමාන්‍ය ඇඳුම් පැළඳුම් භාවිත කෙරේ. ජසයාගේ චරිතයේදී සරම, බැනියම හා ලේන්සුව රංග වස්ත්‍ර ලෙස යොදා ගැනීම නිදසුනක් ලෙස දැක්විය හැකිය. අපර රංග කොටසට අයත් සුවිශේෂී නර්තන අංග වල දී නර්තනයට උචිත වන පරිදි රංග වස්ත්‍රාභරණ යොදා ගෙන ඇත.






පනික්කලේ




ආරච්චි



මුදලි



පොලිස්



## කෝලම් නාටක චරිත මගින් සමාජ විවරණයක් සිදු කෙරෙන ආකාරය

කෝලම් නාටක පැවැත්වීමේ අරමුණ විනෝදාස්වාදය ලබා ගැනීම ද කෝලම් චරිත සහ ඔවුන්ගේ චරිත උපහාසාත්මක බව මතුකර දක්වන බවද දක්නට ලැබේ.

කෝලම් නාටක වල හාස්‍ය රසය මතුකර දක්වන මුදලි තුමා, ආරච්චි රාල වැනි ගමේ ප්‍රභූ චරිත ප්‍රතිනිර්මාණයේ දී ඔවුන් තුල ඇති ඇතැම් දුර්ගුණ සහ සටකපටකම්ද, ඔවුනගේ චරිත ලක්ෂණ ද කලාකරුවාගේ නිර්මාණ මගින් උපහාසත්මක විවේචනයකට හසුකරගන්නා ලදී. එමඟින් කිසියම් ආකාරයක සමාජ විවරණයක්ද, ඒවා ඇසුරු කොට ගනිමින් සමාජ ශෝධනයක්ද, සමාජයේ පිවත් වන ඇතැම් පුද්ගල චරිතවල දෙබිඩි පිළිවෙත ද උපහාසාත්මකව හෙළිදරවු කිරීමෙන් සමාජය වෙත කිසියම් පණිවිඩයක් ලබා දීම සිදු විය.

මේ අනුව ගමේ ඉහල පහල සියලුම තරාතිරම් වලට අයත් චරිත කෝලම් නාටකය මගින් උපහාසාත්මක විවේචනයට හසුකරගත් අතර එමගින් යම් ආකාරයක සමාජ විවරනයක් ද සැපයෙන බව පෙනේ.



## පැවැරුම

1. කෝලම් නාටක ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න.
2. කෝලම් නාටක පැවැත්වීමේ අතීත හා වර්තමාන හේතු 02 බැගින් ඉදිරිපත් කරන්න.
3. එහි රඟ මඩල පිලිබඳ කෙටි විස්තරයක් කරන්න.
4. කෝලම් නාටකයක නර්තනය ගායන වාදන රංගවස්ත්‍රාභරන පිළිබඳ විස්තර කරන්න.
5. කෝලම් නාටක චරිත මගින් සමාජ විවරණයක් සිදු කෙරෙන ආකාරය විස්තර කරන්න.
6. කෝලම් නාටකයක කවියක් ගායනා කරන්න.

# පසුගිය වර්ෂ වල විභාග ප්‍රශ්ණ

## 2016

(01) කෝලම් නාටක චරිත නිරූපණයේදී ..... අධි මානුෂ චරිත්‍ර,

(i) නාග රාක්ෂ, නාග කන්‍යා, සිංහ
(ii) නාග රාක්ෂ, නාග කන්‍යා, කාපිරි
(iii) ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, වලස්
(iv) ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, නාග කන්‍යා

## 2017

(01) කෝලම් නාටකයේ එන සත්ත්ව චරිත දෙක වන්නේ,

(i) කඳුරා සහ කිඳුරිය යි.
(ii) වලහා සහ සිංහයා යි.
(iii) අශ්වයා සහ සිංහයා යි .
(iv) සිංහයා සහ කිඳුරිය යි.

## 2018

(01) " තානායම්පොළ " යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(i) සොකරි රඟ මඩල ය.
(ii) කෝලම් රඟ මඩල ය.
(iii) නාඩගම් රඟ මඩල ය.
(iv) නව රඟ මඩල ය.

## 2019

(01) කෝලම් නාටකයේ ..... පූර්ව රංගයට අයත් අංගයකි.

(i) නරිලතා කෝලම.
(ii) ආරච්චි කෝලම
(iii) මනමේ කෝලම
(iv) ගරිදේවි කෝලම

### කෝලම්

## 2016

(01) (i) සොකරි හා කෝලම් නාටක වල එන චරිත දෙක බැඟින් නම් කරන්න.

(ii) කෝලම් නාටකය පැවැත්වීමේ අතීත හා වර්තමාන අරමුණු සැකෙවින් විස්තර කරන්න.

(iii) සොකරි නාටකයේ රංග භාණ්ඩ හා වස්ත්‍රාභරණ පිළිබඳ විග්‍රහ කරන්න.

## 2018

(01) (i) කෝලම් නාටකයේ ප්‍රධාන ලක්ෂණක් වනුයේ එක් එක් චරිත සඳහා ..... පැළඳීමයි.

(ii) කෝලම් හෝ සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු දෙකක් ලියා රඟ මඩල පිළිබඳ විස්තරයක් කරන්න.

## 2019

(01) (i) කෝලම් නාටකයේ භාවිතා වන ආතත හා සුෂිර වාද්‍ය භාණ්ඩ මොනවාද ?

(අ) ආතත භාණ්ඩය :-

(ආ) සුර භාණ්ඩය :-

(02) දේශීය ජන නාටක අතර සොකරි හා කෝලම් විශේෂ වේ.

(i) කෝලම් නාටකයට අයත් කවියක් ලියා දක්වන්න.

(ii) ගුරුහාමි චරිතය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) සොකරි හා කෝලම් නාටකවල දක්නට ලැබෙන වෙනස්කම් සාකච්ඡා කරන්න.

## 2020

(01) (i) සොකරිගැමි නාටකයේ පුද ලබන දෙවිවරු දෙදෙනෙක් හා ප්‍රචලිත ප්‍රදේශ දෙකක් නම් කරන්න.

(ii) සොකරි සහ කෝලම් නාටකයන්හි රංග වස්ත්‍රාභරණවල වෙනස්කම් දෙකක් වෙන් කොට දක්වන්න.

(iii) කෝලම් නාටකයෙහි එන මානුෂ චරිතයන් නිරූපණයේදී සිදුවන සමාජ ශෝධනය පිළිබඳව විචාරයට ලක් කරන්න.